සැ. යු.-2012.02.17 දින පළ වූ අංක 1,746 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,747 - 2012 පෙබරවාරි මස 24 වැනි සිකුරාදා - 2012.02.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 302 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | -- |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | -- |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 307 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 පෙබරවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපති උතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2012 අංක 189

DRF/21/RECT/2877.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2009 ඔක්තෝබර් මස 06 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

මේජර් සමරකෝන් මුදියන්සේලාගේ අසෝක කැප්පෙටිපොල වනසිංහ, ඒටීඕ ශ්‍රීලයුයුබ (නි/60380).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

02-682

---

2012 අංක 190

DRF/21/RECT/2886.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2009 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

කපිතන් යාලත් මුදියන්සේලාගේ කමල් කුමාර ගුණතිලක, සබුබ (නි/64042).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

02-683

2012 අංක 191

D/22/NY/507.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික හමුදා බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2011 ජූලි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාමගන්වා ඇත :-

කොමදෝරු ට්‍රැවිස් ජෙරම් ලියන්දුරු සින්නයියා, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0219

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

02-677

---

2012 අංක 192

D/22/NY/525.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරී 2012 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :-

කොමාණ්ඩර් (එච්) දේශබන්දුගේ ජනක නිශාන්ත, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0571

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

02-676

2012 අංක 193

MOD/DEF/03/02/RET/08.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 මාර්තු මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාමගන්වා ඇත :-

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) ඌරාගොඩගේ ලක්සිරි ඉඳුනිල් පෙරේරා, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0566

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

02-681

---

2012 අංක 194

MOD/DEF/03/02/RET/05.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක් සහ නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2011 දෙසැම්බර් මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :-

ලුතිනන් කොමාණ්ඩර් (නැබ) ආරච්චිගේ ප්‍රසාද් තුෂාර සුමින්ද සල්ගාදු, එන්ආර්එච් 1318, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-678

---

2012 අංක 195

D/RF/826/NY/02.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

*2008 සැප්තැම්බර් මස 24 වැනි දින සිට ලුතිනන් වශයෙන් :*

1. ලුතිනන් (ඉ) වීරසිංහ පරාක්‍රමගේ තුසිත ප්‍රින්ස් වික්‍රමනායක, එන්ආර්ඊ 2652, ශ්‍රීලංනාහ

*2008 සැප්තැම්බර් මස 24 වැනි දින සිට උපලුතිනන් වශයෙන් :*

2. උපලුතිනන් රසික රංජන අබේවික්‍රම, එන්ආර්එක්ස් 2653, ශ්‍රීලංනාහ ;
3. උපලුතිනන් පටුවත විතානගේ නිසංක, එන්ආර්එක්ස් 2654, ශ්‍රීලංනාහ ;
4. උපලුතිනන් වහුම්පුරයලාගේ විජිත ධර්ම කීර්ති ඇකිරියගල, එන්ආර්එක්ස් 2655, ශ්‍රීලංනාහ ;
5. උපලුතිනන් වික්‍රම ආරච්චිගේ ප්‍රියන්ත කුමාර, එන්ආර්එක්ස් 2656, ශ්‍රීලංනාහ ;
6. උපලුතිනන් ලියනගම කංකානම්ගේ සංජීව මහීන් කුමාර එන්ආර්එක්ස් 2657, ශ්‍රීලංනාහ ;
7. උපලුතිනන් ඉම්හාමි මුදියන්සේලාගේ මංගල සිරිවර්ධන, එන්ආර්එක්ක් 2658, ශ්‍රීලංනාහ ;
8. උපලුතිනන් හර්ෂ දුෂ්මන්ත කොතලාවල, එන්ආර්එක්ස් 2659, ශ්‍රීලංනාහ ;
9. උපලුතිනන් අම්බලන්ගොඩ ලියනගේ අනුරාධ බණ්ඩාර ලියනගේ, එන්ආර්එක්ස් 2660, ශ්‍රීලංනාහ ;
10. උපලුතිනන් කොතලාවල ලියනගේ සම්පත් කුමාර, එන්ආර්එක්ස් 2661, ශ්‍රීලංනාහ ;
11. උපලුතිනන් අඹගහවෙල රත්නායක මුදියන්සේලාගේ දනුෂ්ක බණ්ඩාර රත්නායක, එන්ආර්එක්ස් 2662, ශ්‍රීලංනාහ ;
12. උපලුතිනන් සුසන්ත ප්‍රසන්න සංජීව කංසාය ගමගේ, එන්ආර්එක්ස් 2663, ශ්‍රීලංනාහ ;
13. උපලුතිනන් ගැටන වතුකරගේ මංජුල ප්‍රභාත් කුමාර, එන්ආර්එක්ස් 2664, ශ්‍රීලංනාහ ;
14. උපලුතිනන් දේවතා පේඩිගේ චුලන්ත චන්දන ගුණතිලක එන්ආර්එක්ස් 2665,ශ්‍රීලංනාහ ;
15. උපලුතිනන් (සැ) අනුරාධ බණ්ඩාර විජයරත්න ජයසුන්දර, එන්ආර්එස් 2666, ශ්‍රීලංනාහ ;
16. උපලුතිනන් (සැ) වීරසූරිය ආරච්චිගේ කැලුම් සම්පත් වීරසූරිය එන්ආර්එස් 2667, ශ්‍රීලංනාහ ;
17. උපලුතිනන් (සැ) චතුර ජානක දිසානායක එන්ආර්එස් 2668, ශ්‍රීලංනාහ
18. උපලුතිනන් (සැ) යොෂාන් බිමල්ක සමරවික්‍රම, එන්ආර්එස් 2669, ශ්‍රීලංනාහ ;
19. උපලුතිනන් (නාසෙ) දිසානායක මුදියන්සේලාගේ නාමල් බණ්ඩාර එන්ආර්පී 2670 ශ්‍රීලංනාහ ;
20. උපලුතිනන් (නාසෙ) හෙල්කුඹුරේ ගෙදර තුෂාර ප්‍රියන්ත කුමාර, එන්ආර්පී 2671, ශ්‍රීලංනාහ ;
21. උපලුතිනන් (නාසෙ) පහමුණු පතිරැන්නැහැලාගේ සංජීව ඉන්දික පතිරණ, එන්ආර්පී 2672, ශ්‍රීලංනාහ ;

*2008 දෙසැම්බර් මස 14 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් වශයෙන් :*

22. මධ්‍ය නිලධාරී සමරකෝන් අප්පුහාමිලාගේ සමීර මධුසංක සමරකෝන්, එන්ආර්එල් 2441, ශ්‍රීලංනාහ ;
23. මධ්‍ය නිලධාරී කරුණානායක හඳගම රාළලාගේ චානක රංජය කරුණානායක, එන්ආර්එල් 2445, ශ්‍රීලංනාහ ;
24. මධ්‍ය නිලධාරී කහඳ ගමගේ චමින්ද පත්මාල්, එන්ආර්ර් 2446, ශ්‍රීලංනාහ ;
25. මධ්‍ය නිලධාරී වර්ණකුලසූරිය මහවඩුගේ රජත ප්‍රවීන් නිසංසල ප්‍රනාන්දු, එන්ආර්ර් 2447, ශ්‍රීලංනාහ ;
26. මධ්‍ය නිලධාරී කස්තුරි ආරච්චිලාගේ වරුණ කස්තුරිආරච්චි, එන්ආර්ර් 2448, ශ්‍රීලංනාහ ;
27. මධ්‍ය නිලධාරී කවිසේකර මුදියන්සේලාගේ නුවන් කවිසේකර, එන්ආර්ර් 2449, ශ්‍රීලංනාහ ;
28. මධ්‍ය නිලධාරී දීගොඩ ගමගේ සංඛ විදුරංග ගමගේ, එන්ආර්එල් 2453, ශ්‍රීලංනාහ ;
29. මධ්‍ය නිලධාරී එදුසූරිය ආරච්චිගේ ශ්‍රීමාල් හෂාන්ත විජේසිංහ, එන්ආර්එල් 2454, ශ්‍රීලංනාහ ;
30. මධ්‍ය නිලධාරී ජයංග රිව්රාජ මීගහගේ, එන්ආර්එල් 2455, ශ්‍රීලංනාහ ;

*2009 මාර්තු මස 14 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

31. උපලුතිනන් (වි) ලිහිණිකඩු ආරච්චිගේ අජිත් සුරංග, එන්ආර්එල් 2718, ශ්‍රීලංනාහ ;
32. උප ලුතිනන් (වි) හෙම්බාදුර රායි ප්‍රසාද් සිල්වා, එන්ආර්එල් 2719, ශ්‍රීලංනාහ ;
33. උපලුතිනන් (වි) සුදු හකුරුගේ ප්‍රසාද් දයාරත්න, එන්ආර්එල් 2720, ශ්‍රීලංනාහ ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

02-741

---

2012 අංක 196

MOD/DEF/03/02/VNF/PRO.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීම්

*2010 ජූලි මස 01 සිට කපිතාන් (ස්වේ) වශයෙන් :-*

කොමාණ්ඩර් (සිඉ) (තාවකාලික කපිතාන් (සිඉ)) මාබුලගේ ප්‍රියන්තා රංජනි චන්ද්‍රසේකර, ශ්‍රීලංස්වේනාහ - එන්වීසී 5300

වෛද්‍ය කොමාණ්ඩර් (තාවකාලික වෛද්‍ය කපිතාන්) නෙඹ්මාල් මේරියොන් ඇලෙක්සැන්ඩර් පෙරේරා, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑම් 5395

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

02-679

---

2012 අංක 197

D/VF/194/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක්

*2011 ජූලි මස 15 වැනි දින සිවිල් ඉංජිනේරු ලුතිනන් කොමාණ්ඩර් (ස්වේච්ඡා) වශයෙන් :-*

යටගම ගමගේ අනුෂ්කා දිල්හානි, එන්වීසී 5715

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-680

---

2012 අංක 198

D/AF/908.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2012 ජනවාරි මස 19 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

එයාර් කොමොඩෝර් අනිල් පුෂ්ප ශාන්ත නරසිංහ (01387) - පරිපාලන

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

02-685

---

2012 අංක 199

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමදෝරු නිළයට උසස් කෙරේ :

තාවකාලික එයාර් කොමදෝරු ඔබදවත්තගේ පිනත් හර්ෂ විරාජ් ප්‍රනාන්දු (01405) කාර්මික/ඉංජි - 2011.10.17

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

02-744

---

2012 අංක 200

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2010 ජනවාරි මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

ගෲප් කැප්ටන් මෙල්වින් රෙෆල් කුරුකුලසූරිය (01551) - නියමු පොදු රාජකාරී

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

02-688

---

2012 අංක 201

D/AF/897.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2011 අගෝස්තු මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

ගෲප් කැප්ටන් සිසිර ප්‍රියන්ත අධිකාරම් (01499) - නියමු පොදු රාජකාරී

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

02-686

---

2012 අංක 202

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2009 අප්‍රේල් මස 30 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

විං කමාන්ඩර් හංවැල්ල මුදියන්සේලාගේ ලලිත් හේමන්ත හුලංගමුව (01486) - පරිපාලන/රෙජිමේන්තුව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

02-745

---

2012 අංක 203

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2009 දෙසැම්බර් මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත ː

විං කමාන්ඩර් සේදිගල්ලගේ සුදිල් දේවප්‍රිය පීරිස් (01581) - පරිපාලන/රෙජිමේන්තුව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

02-687

---

2012 අංක 204

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2009 දෙසැම්බර් මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත ː

විං කමාන්ඩර් වරුණ චාමින්ද සේනාරත්න (01697) - නියමු පොදු රාජකාරි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

02-742

---

2012 අංක 205

D/AF/895.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

1981 ශ්‍රී ලංකා ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහයේ 3(2) වැනි රෙගුලාසියට අනුව 2011 සැප්තැම්බර් මස 21 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත ː

තාවකාලික විංග් කොමාන්ඩර් කුරුප්පු අච්චිගේ උපුල් ආනන්ද කුමාර (01570) - සැපයුම්

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

02-684

---

2012 අංක 206

D/AF/904.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2012 ජනවාරි මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත ː

ස්කොඩ්රන් ලීඩර් දේගිරි කෝසල ප්‍රසන්න ඩී සොයිසා ගුණසේකර (01715) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

02-743

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පී. එල්. සී.

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

අයි. ආර්. ප්‍රේමතිලක.
ගිණුම් අංකය : 1067 5315 3900.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 දෙසැම්බර් මස 30 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2006 සැප්තැම්බර් 22 දාතම හා අංක 1673 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉලවන්දර රසාර ප්‍රේමතිලක යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1675 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හය ලක්ෂ තිස් හත් දහස් අටසිය අනූ පහයි ශත අනූ හතක (රු. 637,895.97) මුදලක් 2010 සැප්තැම්බර් 30 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතු ඇති හෙයින් ද, එකී රුපියල් හය ලක්ෂ තිස් හත් දහස් අටසිය අනූ පහයි ශත අනූ හතක (රු. 637,895.97) මුදලද, 2010 ඔක්තෝබර් 01 දින සිට අංක 1673 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ හැට හය දහස් හත්සිය විස්සයි ශත දහ තුනක (රු. 566,720.13) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1673 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසි කරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්පේ ග්‍රාමයේ පිහිටි "දඹුගහලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ජයසූරිය යන අය විසින් සාදන ලද 2001 අප්‍රේල් 08 සහ 2001 ජූනි 16 දාතම හා අංක 1934 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට: මෙහි ලොට් 25; නැගෙනහිරට: ලොට් 3; දකුණට ලොට් 23 (පාර) සහ බස්නාහිරට: ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 11.70) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 1934 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව N246/268 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද, සමගය.

වෙළුම/පත්‍රිරුව N246/42 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇති අංක 1934 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 23 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

02-702

---

## මහජන බැංකුව - මොරටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද 2009.12.24 දිනැති අංක 3778 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම වීරහැන්නැදිගේ වීරබල ජයසූරිය පටබැඳිගේ ඇන්තනි දිනේශ් විශේන්ද්‍ර ප්‍රනාන්දු මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු.750,000) හා රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු.750,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.01.04 දින සිට වර්ෂයකට සියයට දහ හත බැගින් (17%) රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු.750,000) හා 2010.03.10 දින සිට වර්ෂයකට සියයට දහහත (17%) බැගින් රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු.750,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත් ලක්ෂ පනස් දහසක (රු.750,000) හා රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු.750,000) මුදලක් අය කර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 3778 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තර**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ එගොඩ උයන, ශ්‍රමශක්ති මාවතේ වරිපනම් අංක 68/9 දරන ස්ථානයේ පිහිටි "දොඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ටී. එම්. ඩබ්. සමරනායක මහතා විසින් 2007.05.25 වැනි දින මැන සාදන ලද අංක 3225 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 6 දරන කොටසට මායිම් :-

උතුරට : ශ්‍රමශක්ති මාවතේ වරිපනම් අංක 68/11 සහ ශ්‍රම ශක්ති මාවත ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ජේ. ඩබ්. රොඩ්රිගෝ මහතාගේ අංක 2661 දරන පිඹුරේ ලොට් අංක 1 ද, දකුණට : රොස්ලින් ප්‍රනාන්දුට සහ තවත් අයට අයත් ඉඩම් ද, බස්නාහිරට : එම්. දයානන්දට අයිති ඉඩම සහ ශ්‍රම ශක්ති මාවතේ වරිපනම් අංක 68/11, දරන ඉඩම ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් විස්සයි දශම හතයි පහක් (අ.0, රූ. 0, පර්. 20.75) හෙවත් හෙ. 0.0525 විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3066/700 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප II

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

02-695

පීවීඑස් 167.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සුන්දරම්ස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "1944.07.01" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සුන්දරම්ස් ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සුන්දරම්ස් ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ජනවාරි මස 26 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-746

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.